1978 - - -3

# ජාතික රාජ්‍ය සභාවේ
# 1978 අංක 11 දරන
# නීති කොමිෂන් සභා (සංශෝධන)
# පනත

[සහතිකය සටහන් කළේ 1978 අප්‍රේල් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 අප්‍රේල් මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 25 යි.    තැපැල් ගාස්තුව : ශත 15 යි.

## ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 11 දරන නීති කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 අප්‍රේල් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 55/77.

**1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 11 දරන නීති කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1969 අංක 3 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) මේ පනතේ කාර්ය සඳහා නීති කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම කොමිෂන් සභාවට පත් කිරීම සඳහා යෝග්‍ය සුදුසුකම් ලබා ඇතැයි ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු සභාපතිවරයකුගෙන් ද දසයකට අඩු නොවන සහ දාහතරකට වැඩි නොවන වෙනත් කොමසාරිස්වරයන් සංඛ්‍යාවකින් ද එම කොමිෂන් සභාව සමන්විත විය යුතු ය. තවද ඔවුන්ගෙන් වැඩි දෙනකු අධිකරණ ධුර දරූ හෝ දරන හෝ නීතිඥවරයන් වශයෙන් හෝ නීතිය පිළිබඳ ගුරුවරයන් වශයෙන් පළපුරුද්දක් ඇති හෝ නීතියෙහි ලා ශාස්ත්‍රීය සුදුසුකම් ඇති තැනැත්තන් විය යුතු ය.".

2— ජ 33806—10,650 (78/04)